සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ......................................... සිංහල සාහිත්‍ය රසාස්වාදය කාලය : පැය 03යි.

වැදගත් :

✻ I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත් II කොටසෙහි 3 වන ප්‍රශ්නයටත් III කොටසේ 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (i) සිට (v) තෙක් දී ඇති කොටස් කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''දේවයන් වහන්ස, මාගෙන් වෙන් ව නුඹ වහන්සේ රාජ්‍ය ශ්‍රී විභූතිය හැර අපමණ දුක්ඛයෙන් යම් පමණ කලක් ඉක්මවන ලද ද එපමණ කාලයක් මුළුල්ලේහි මා විසිනුත් දුර්භෝජන දුක්ඛසෙය්‍යාදීන් හා ස්නානපාන රහිත වීමෙන් නුඹ වහන්සේ සේ ම දුකින් ම දවස් යවන ලද්දේ ය.''

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) දේවයන් වහන්ස යනුවෙන් අමතන්නේ කා හට ද?

(ii) දියනෙත උදා වන සිය කිරණින් මහරු
මෙදියත දිවා බිහි දුරු වෙයි ගන අඳුරු
.........................................................................................
.........................................................................................

(අ) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) පදවල අර්ථ වෙන වෙනම ලියන්න.

(i) දියනෙත - (ii) දුක්'ඳුරු -

(iii) ''එක අතකට පොඩි අයියවත් නො බැඳ කොහොම ද? අම්මත් දැන් හොඳට ම දුර්වලයි.''

(අ) මේ ප්‍රකාශය කළේ කවු ද?

(ආ) මෙම කොටස උපුටාගත් කෘතියේ කතුවරයා ගේ නම ලියන්න.

(iv) සුදු වළාකුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි, ඔබ යෑම පහත් වැ මැ යි

(අ) කවි පන්තිය උපුටාගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?

(ආ) කතුවරයාගේ ළමා කෘති දෙකක නම් ලියන්න.

(v) ''ස්වාමීනි, මුඹ වහන්සේ බුදු බව සාධා ගන්ට දුක් ගන්නා සමයෙ ගන්නා දුක් බලවත් හෙයින් ඒ දේවතාවෙක් මා ළඟට අවුත් මුඹ වහන්සේ මළැයි යන්නක් කී ය.''

(අ) මෙම කොටස ඇතුළත් වන ග්‍රන්ථයේ නම හා එහි කතුවරයාගේ නම ලියන්න.

(ආ) ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් ද? (ලකුණු 4X5=20යි)

(02) පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න.

හිස නමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවා ගති
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය

දූල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළි අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නො පෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඈ
වුවමනාවත් කිසිත් නැති ව ද
නොරුඳෙයි, පලා යෙයි

ගෑ විලවුනෙහි
නැත, රන්වන් සමෙහි
හෙළන සුස් මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දැනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන

(i) මෙම කවි පෙළ අයත් කාව්‍ය ආකෘතිය කුමක් ද?
(ii) කවිපෙළට වස්තු විෂයය වී ඇත්තේ කුමක් දැයි කෙටියෙන් දක්වන්න.
(iii) කවියා යොදාගෙන ඇති භාෂාව රස නිෂ්පත්තියට කොතෙක් දුරට ගැළපේ ද?
(iv) චිත්ත රූප මැවීමට කවියා සතු ප්‍රතිභාව කවි පෙළෙන් උදාහරණ දෙකක් දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.
(v) කවි පෙළෙන් පාඨකයාට ගත හැකි ජීවන දෘෂ්ටිය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 5X5=25යි)

## II කොටස

★ **පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක් කොටසකට පමණක් උත්තර සපයන්න.**

(03) ඉක්බිති රජ්ජුරුවෝ පිබිද බිසවුන් දැක ''දේවිනි කවුරුන් විසින් ගෙන යන ලද දෑ'යි විචාරා ශක්‍රදේවීන්ද්‍රයන් විසිනැයි කීකල'' මේ කිමෙක් ද මහලු බමුණෙකු ගෙන ගිය නියාව මම දිටිම් කුමක් කියා මට වළහා කියව් දෑ'යි කිවු ය. දේවයන් වහන්ස, අදහාගත මැනව. ශක්‍රදේවේන්ද්‍රයෝ මා හැරගෙන දිව්‍යලෝකයට ගියාහුය'යි දෙවෙනි තුන්වෙනිවත් කියා ගිවිස්වාලිය නොහී ශක්‍රදේවේන්ද්‍රයන් විසින් දෙන ලද කුසතණ හා දිවසළු ආදිය පෑ ගිවිස්සා ලූහ වන්නාට ශක්‍ර දේවේන්ද්‍රයෝ තොප ගෙන ගියෝ ය. දරු කෙනෙකුන් ලදුදෑ'යි විචාර ''එසේය දේවයන් වහන්ස, දරු කෙනෙකුන් ලදිමි කිවු ය.''

(i) මෙහි සඳහන් වන ආකාරයට ශක්‍ර දේවේන්ද්‍රයන් බිසව දිව්‍යලෝකයට රැගෙන යාමට හේතුව කුමක් ද? (ලකුණු 05)
(ii) දිව්‍යලෝකයට ගිය බව සනාථ කිරීමට යොදා ගත්තේ මොනවා ද? (ලකුණු 05)
(iii) මෙහි බිසව යනුවෙන් සඳහන් කර ඇත්තේ කවු ද? (ලකුණු 05)
(iv) ''දරු කෙනෙකුන් ලදිමි'' කිවූ පසු රජතුමා විසින් කරන ලද්දේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

**නැතහොත්,**

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුම පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි

විහාර මහ මැණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි.
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළඳා හිමි රැඳි විමනේ
බුදු රැස් දහරයි
හැම දා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතු වී
යසස උදාවෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි

(i) කවි පෙළ අයත් වන කවි වර්ගය කුමක් ද? (ලකුණු 05)

(ii) කවි පෙළෙන් කියවෙන අනුභූතිය කුමක් ද? (ලකුණු 05)

(iii) මෙම කාව්‍ය නිර්මාණයේ භාෂාව එහි සාර්ථකත්වයට කුමන පිටිවහලක් වී දැයි විමසන්න. (ලකුණු 05)

(iv) කවි පෙළ සාර්ථක කර ගැනීමෙහි ලා කවියා ඉවහල් කරගෙන ඇති කාව්‍ය උපක්‍රම මොනවා දැයි උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

## III කොටස

★ **මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (පිළිතුරක වචන 150ක් වත් තිබිය යුතු ය.)**

(04) සාරධර්මවලින් පිරි ගුණගරුක සමාජයක් ගොඩනැංවීම උදෙසා කතුවරයා ගෙන ඇති උත්සාහය සුභාෂිතයේ නියමිත කවි ඇසුරින් පහදන්න. (ලකුණු 15)

(05) තුංමංහංදිය නව කතාවේ ලොකු මාමාගේ චරිත නිරූපණය පිළිබඳව විවරණයක් කරන්න. (ලකුණු 15යි)

(06) මිනිස් සන්තානයේ පවත්නා වූ ගුඪ සිතිවිලිවල ස්වභාවය ඉදිරිපත් කිරීමට ජාතක කතාකරුවා දක්වන්නේ මහත් දක්ෂතාවයකි.'' කුස රජුගේ චරිත ඇසුරෙන් මේ කියමන විමසන්න. (ලකුණු 15)

(07) ''උතුරෙන් කවි පෙළ'' අද සමාජයට ගැළපෙන කාලීන වටිනාකමකින් යුත්ත කාව්‍ය නිර්මාණයකි.'' මේ කියමන පිළිබඳව කවි පෙළ ඇසුරෙන් විමසීමක් කරන්න. (ලකුණු 15යි)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

47 S I,II,III

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 11 - 2019**

# සිංහල සාහිත්‍ය රසාස්වාදය පිළිතුරු පත්‍රය

## I කොටස

(01) (i) (අ) පබාවතී දේවිය

(ආ) කුස රජුට

(ii) (අ) සිරිමත රජ තුමකු දුටු පමණින් සොඳුරු

ඇතුළත පිටත දිව රැ හැරෙය දුක්'ඳුරු

(ආ) දියනෙත - සූර්යයා

දුක් ඳුරු - දුක නැමැති අඳුර

(iii)(අ) පුංචි අම්මා

(ආ) මහගමසේකර මහතා

(iv) (අ) කියවන නුවණ

(ආ) හීංසැරය / හත් පණ / මගුල් කැම / කුමාර ගී

(v) (අ) සද්ධර්මරත්නාවලිය, ධර්මසේන හිමි

(ආ) සුදොවුන් රජතුමා

(කොටසකට ලකුණු 2x10=20යි.)

(02) (i) නිසඳැස් කාව්‍ය ආකෘතිය (නිදහස්)

(ii) අලුත ගෙනා මනාලියගේ හැසිරීමේ ස්වරූපය දැන්වීම.

(iii) රූපකාර්ථවත් බව, සම්භාව්‍ය භාෂාව යොදා ගැනීම, ව්‍යංග්‍යාර්ථවත් බව ආදී ලක්ෂණ

(iv) දූල් තිර අස්සෙන් පෙනෙයි ඈ

මා වෙත නෙත් ඈ, වුවමනාවන් කිසිත් නැති වද, නොරුඳෙයි පලා යෙයි

(v) දෙහදක බැඳෙන අධ්‍යාත්මික බැඳීම කොතරම් සුන්දර ද යන්න වැනි කරුණු ගත හැකි ය.

## II කොටස

(01) (i) දරුවෙකු ලබාදීමට

(ii) ශක්‍රයා දුන් කුස තණ හා දිව සළු ආදිය

(iii) සිලවතී අග බිසය

(iv) බිසව වෙනුවෙන් ගබ පෙරහරක් පැවැත්වීම

නැතහොත්

(i) දේශාභිමානී කවි

(ii) ශ්‍රී ලකාවේ ඓතිහාසික වැදගත්කම, ජාතික වීරයෝ, උරුමයන්, ස්වභාව සෞන්දර්ය ආදිය වර්ණ කිරීම.

(iii) සරල භාෂාවක් යොදාගෙන තිබීම.

රූපකාර්ථවත් බව

ව්‍යංග්‍යාර්ථය වැනි කරුණු අවධානයට යොමු කරන්න.

(iv) උත්ප්‍රේක්ෂාලංකාරය

රූපකාර්ථවත් භාෂාව

අනුප්‍රාසය

සරල භාෂාව

## III කොටස

4, 5, 6, 7 යන ප්‍රශ්නවලින් ප්‍රස්තුතයට අදාළව කරුණු හා උද්ධෘත ඇතුළත් කර ලියා ඇත්නම් ගැළපෙන ලකුණු ලබා දෙන්න.